ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No .
දිනය / திகதி / Date. 2024.10.22

පැමිණිලි පාර්ශවය : එම්.එච්.ජ්.සුභසිංහ මහතා,
අංක 45/3,
ගංහත,
වෙලම්බඩ.

වගඋත්තරකාර පාර්ශවය : 1. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
වෙලම්බඩ.

2. උ.පො.ප. දිසානායක මයා,
පොලිස් ස්ථානය,
වෙලම්බඩ.

3. පො.කො.ධනුෂ්ක මයා,
පොලිස් ස්ථානය,
වෙලම්බඩ.

<u>පැමිණිලි අංකය : **HRC/KND/458/22**</u>

<u>පැමිණිල්ල මගින් ඉදිරිපත් කර සිටින කරුණු:</u>

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා මහනුවර ශ්‍රී දළදා මාළිගාව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරන අතර, තමාගේ බිරිඳ ද කාන්තා පොලිස් සැරයන්වරියක ලෙස පොලිස් අභ්‍යාස විද්‍යාලයට අනුයුක්තව සේවය කරන බවත්, තමන් දෙදෙනාට වයස අවු 23 ක හා අවු 21 යන වයස්වල පසුවන පිරිමි දරුවන් දෙදෙනෙකු සිටින බවත්, වැඩිමහල් දරුවා එම්.එච්.කවිදු හේෂාන් බණ්ඩාර සුභසිංහ හා බාල දරුවා එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර සුභසිංහ යන අය බවත්ය.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

2022.09.14 වන දින තමන් දෙදෙනාගේම අවසරය පරිදි ගමට ආසන්නයේ උඩුනුවර මධ්‍ය මහා විද්‍යාලයේ පැවැත්වූ සැණකෙලි සංදර්ශනයක් නැරඹීම සඳහා පැය 20.00 ට හෝ ඊට ආසන්න වේලාවක තමාට අයත් අංක CP WM 4654 දරණ යතුරු පැදියෙන් දරුවන් දෙදෙනාම පිටව ගිය බවත්, වැඩිමහල් දරුවා වන එම්.එච්.කවිඳු හේෂාන්ව විසින් යතුරු පැදිය පදවාගෙන ගිය බවත්, දරුවන් පිටව ගොස් පැය භාගයකට පමණ පසු වෙලම්බොඩ පොලීසියේ උප පොලිස් පරික්ෂක දිසානායක යන අය විසින් දුරකථන ඇමතුමක් ගෙන දරුවන් දෙදෙනාම අත්අඩංගුවට ගෙන ඇති බැවින් පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස දැනුම් දෙන ලද බවත්, ඒ අනුව බිරිඳ වෙලම්බොඩ පොලීසිය වෙත යන විට දරුවන් දෙදෙනාම එහි රඳවා සිටි බවත්, පැය කිහිපයකට පසුව බිරිඳ බාල දරුවා වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර සමඟ නිවසට පැමිණි අතර, වැඩිමහල් දරුවා වන එම්.එච්.කවිඳු හේෂාන්ව සිර මැදිරියට දැමූ බව තමන් සමඟ පැවසූ බවත් සඳහන් කර ඇත. සිද්ධිය සම්බන්ධයෙන් බාල දරුවා වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාරගෙන් විමසීම් කිරීමේදී, බඹරදෙනිය හන්දියේ පාලම අසලදී මුහුණට විදුලි පන්දම යොමු කර යතුරුපැදිය නවත්වා එතැන සිටි පො.කො 81367 ධනුෂ්ක විසින් උ.පො.ප දිසානායක වෙත "සර් මුන්ගේ අප්පා තමා අපට කෙලවන්න යන්නේ මුන් දෙන්නා දාමු" යැයි පැවසූ බවත්, පසුව පො.කො.ධනුෂ්ක යන අය ඔහුගේ අතෙහි යමක් තබාගෙන වැඩිමහල් දරුවා වන එම්.එච්.කවිඳු හේෂාන්ගේ දැඩි විරෝධය මත කලිසම් සාක්කුවට අත දැමීමට උත්සහ දරා ඇති අතර, එවිට "සාක්කුව එළියට අරගෙන පෙන්වන්නම්" යැයි පවසා සිටීමේදී "ඇයි උඹ වන්ඩිද, අම්මයි තාත්තයි පොලීසියේ නිසාද උබගේ කට" කියා තම දරුවන් දෙදෙනාට ඔහු අත තිබූ එක් අත්විලංගුව දමා ජීප් රථයට දමාගෙන වෙලම්බොඩ පොලීසියට ගොස් ඇති බවත් පැවසූ බව සඳහන් කරයි.

එසේම, තම නිවස පිහිටා ඇත්තේ, ඔවුන් ගමන් ගන්නා මාර්ගයේ වුවද, දරුවන් අත්අඩංගුවට ගැනීම පිළිබඳ නිවැසියන් දැනුවත් කිරීමටද ඔවුන්ට අවස්ථාවක් ලබා දී නොමැති බවත්, පසුව බාල දරුවා වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් විරෝධයක් නොමැති බවට ඔහුගෙන් ප්‍රකාශයක් ගෙන ඇති අතර, එය කුමන අරමුණක් සඳහා ලබාගත්තේදැයි ගැටළු සහගත බවත්, පසුව තම වැඩිමහල් දරුවා වන එම්.එච්.කවිඳු හේෂාන්ට එරෙහිව නීති විරෝධී ගංජා ළඟ තබාගැනීමේ චෝදනාවට අංක 35057/22 යටතේ ගම්පොල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර, තම දරුවා නිවැරදිකරු කිමෙන් මෙම නඩුව විභාග වෙමින් පවතින බවත් පැමිණිල්ලෙන් සඳහන් කර ඇත.

මෙහිදී පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර සිටින්නේ, තම වැඩිමහල් දරුවා වන එම්.එච්.කවිඳු හේෂාන් සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් නීති විරෝධී මත්ද්‍රව්‍ය චෝදනා ඉදිරිපත් කළද, බාල දරුවා වන දේවින්ද බන්ඩාර සම්බන්ධයෙන් එවැනි කිසිදු චෝදනාවක් ඉදිරිපත් කර නොමැති බවයි. ඒ අනුව දේවින්ද බණ්ඩාරව යතුරු පැදියද සමඟ නැවත නිවසට එවීමට හැකියාව පැවතියදීත් වගඋත්තර පාර්ශවය විසින් අත්තනෝමතිකව තම බාල දරුවාද කිසිදු චෝදනාවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇති බවද සඳහන් කරයි.

තමන් සමඟ පොලීසියේ උසස් නිලධාරීන් ඇති අමනාපකම්වල ප්‍රතිඵලයක් ලෙස තමාගේ දරුවන්ගෙන් පළිගැනීමට අසත්‍ය චෝදනා ඉදිරිපත් කරමින් මෙවැනි දේ කරන බවට දක්වා සිටින පැමිණිලිකරු, මේ පිළිබඳව කරුණු සොයාබලා සාධාරණයක් ඉටුකරදෙන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටී.

__පැමිණිල්ලට අදාළව වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන ප්‍රකාශ :-__

ඉහත පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවීය වෙලම්බඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවෙන් දක්වා ඇත්තේ, 2022.09.14 දින තමාගේ නියෝග අංක 252/22 පරිදි පැය 18.00 ට සිට පැය 06.00 දක්වා රාත්‍රී ජංගම සංචාරය සඳහා පො.කො.රි 17620 මහලේකම් යන නිලධාරියා විසින් පදවන ලද අංක 61-5375 දරණ ජීප් රථයෙන් උ.පො.ප දිසානායක, පො.කො 81367 ධනුෂ්ක යන නිලධාරීන් පිටව ගිය බවත්, තමාගේ නියෝග පරිදි තලාව හංදියේ ක්ෂණික මාර්ග බාධක රාජකාරියේ යෙදී සිටියදී සැකකටයුතු පුද්ගලයින් හා වාහන පරීක්ෂාවට ලක්කළ බවත්, ඒ අනුව ගම්හත දෙස සිට බූවැලිකඩ දෙසට ධාවනය වූ අංක CP WM 4654 දරණ යතුරුපැදිය නවතා පරික්ෂා කර ඇති බවත්, එහි පැදිකරු වශයෙන් අංක 45/3,ගම්හත, වෙළම්බොඩ ලිපිනයේ පදිංචි එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර සුබසිංහ නැමැති අය සහ පිටුපස ගමන් කළ එම්.එම් කවිදු හේෂාන් බණ්ඩාර සුභසිංහ නැමති අය උ.පො.ප දිසානායක නිලධාරියා විසින් පරික්ෂාවට ලක්කරන අවස්ථාවේදී සැකකටයුතු අයුරින් හැසිරීම හේතුවෙන් පරික්ෂා කිරීමේදී එම් .එම්. කවිදු හේෂාන් බණ්ඩාර සුභසිංහ යන අය හැඳ සිටි කලිසමේ පිටුපස සාක්කුවේ තිබී කොළපාට කොළයක ඔතන ලද යමක් හමුවී ඇති බවත්, එය පරීක්ෂා කිරීමේදී එය නීති විරෝධී මත් ද්‍රව්‍යයක් වන කැබිස් සැටයිවා එල් නොහොත් ගංජා බවට තහවුරු කරගැනීමෙන් පසු වරද කියා දී තලාව ප්‍රදේශයේදී පැය 19.10 ට අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත.

සැකකරු අත්අඩංගුවට ගෙන නිලධාරීන් විසින් ජීප් රථයෙන් පොලිස් ස්ථානයට රැගෙනවිත් ඇති අතර, ඔහුගේ සහෝදරයා වන එම්.එච්.ඕ. දේවින්ද බන්ඩාර යන අය යතුරු පැදියෙන් පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති බවත්, ගංජා ලඟ තබා ගැනීම සම්බන්ධයෙන් අත්අඩගුවට ගත් එම්.එච් කවිදු හේෂාන් යන අය ඉදිරියේ උ.පො.ප දිසානායක යන නිලධාරීයා විසින් පුද්ගලික ඉලෙක්ට්‍රොනික තරාදියෙන් එම ගංජා කිරා බලා එහි මිලි ග්‍රෑම් 410 ක් තිබූ බවට තහවුරු කරගෙන ඇති බවත් එම නඩු භාණ්ඩ අංක 25/2022 යටතේ ඇතුළත් කර ඇති බවත් දක්වයි.

එසේම පැමිණිල්ලේ සඳහන් කරන සියළු චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, සැකකරුවන් පළායාම වැළැක්වීම සඳහා හා ඔවුන්ගේ ආරක්ෂාව සඳහා නීත්‍යානුකූල ආකාරයෙන් පූර්ණ පරීක්ෂාවක් සිදුකිරීම සඳහා අත්විලංගු යොදා අත්අඩංගුවට ගෙන ඇති බවත්, පොලිස් ස්ථානයට රැගෙන ආ පසු අත්විලංගු මුදවා හැරීමට කටයුතු කර ඇති බවත්, පොලිස් ස්ථානය වෙත යතුරු පැදිය රැගෙන ආවේ සැකකරුගේ බාල සහෝදරයා වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර විසින් බවත්, නැවත ඔහු විසින්ම යතුරු පැදිය

පණගන්වාගෙන රැගෙන ගොස් ඇති බවත්, මෙම පැමිණිල්ල පැමිණිලිකරු විසින් පොලීසිය සමඟ ද්වේශයෙන් සිදුකරන ලද්දක් බවත් දක්වා සිටී.

__පරීක්ෂණයේදී ඉදිරිපත් වූ කරුණු :-__

පැමිණිලිකරු පොලිස් සැරයන්වරයෙකු ලෙස මහනුවර ශ්‍රී දළදා මාළිගා පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරන අතර, පැමිණිලිකරුගේ භාර්යාවද, පොලිස් සැරයන්වරියක ලෙස සේවය කරන බවත්, වයස අවු 23 ක් වන එම්.එච්.කවිදු හේෂාන් බණ්ඩාර හා වයස අවු 21 ක් වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර යන දරුවන් දෙදෙනෙකු සිටින බව පැමිණිල්ලෙන් දක්වයි.

2022.09.14 දින උඩුනුවර මධ්‍ය මහා විද්‍යාලයේ පැවැත්වූ සැණකෙළියක් නැරඹීම සඳහා ඉහත කී දෙදෙනා පැමිණිලිකරුට අයත් CP WM 4654 දරණ යතුරු පැදියෙන් ගොස් ඇති අතර, එය පදවාගෙන ගොස් ඇත්තේ, වැඩිමහල් දරුවා වන එම්.එච්. කවිදු හේෂාන් වන අතර ඔහුගේ සහෝදරයා දේවින්ද බණ්ඩාර පිටුපස ආසනය මත සිටි බව දැක්වේ.

දරුවන් දෙදෙනා යතුරු පැදියේ ගමන් කරමින් සිටින අතරතුර බඹරදෙණිය නගරයේ පාලම අසලදී වගඋත්තර පාර්ශවීය පොලිස් නිලධාරීන් විසින් යතුරු පැදිය නවත්වා පරීක්ෂා කර ඇති අතර, පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවා වන එම්.එච්.කවිදු හේෂාන් බන්ඩාර යන අයගේ විරෝධය නොතකා ඔහුගේ කලිසම් සාක්කුවට අත දමා පරික්ෂා කිරීමෙන් පසු දරුවන් දෙදෙනාටම එක් අත්විලංගුවක් දමා ජීප් රථයට දමාගෙන පොලීසිය වෙත රැගෙන ගොස් ඇති බවත් එහි සිටි පො.කො.ධනුෂ්ක විසින් යතුරු පැදිය රැගෙන ගොස් ඇති බවත් පැමිණිල්ලේ කරුණු දැක්වීමේ දී සඳහන් කර ඇත.

පැමිණිලිකරුගේ දරුවන් දෙදෙනා පොලිස් ස්ථානයට රැගෙන යන මාර්ගය අසල පැමිණිලිකරුගේ නිවස පිහිටා ඇති අතර, දරුවන් දෙදෙනා විසින් තමන්ව පොලිස් ස්ථානයට රැගෙන යාම සම්බන්ධයෙන් නිවසේ සිටින තම මවට දැනුම්දීමට අවශ්‍ය බවට වගඋත්තරකාර නිලධාරින්ට දන්වා ඇතත්, ඒ සඳහා අවස්ථාව ලබා දී නොමැති බව නිරික්ෂණය වේ.

දරුවන් දෙදෙනා අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේදී පැමිණිලිකරුගේ බාල දරුවා වන එම්.එච්.ඕ.දේවින්ද බන්ඩාර යන අයව පරික්ෂා කිරිමේදී කිසිදු තහනම් මත්ද්‍රව්‍යයක් ඔහු සන්තකයේ නොතිබියදී ඔහුව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගොස් පසුව ඔහුගේ මව කැඳවා ඇයට භාරදීම මඟින් පෙනී යන්නේ, ඔහුව කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම මඟින් නීති විරෝධී අත්අඩංගුවට ගැනීමක් සිදුකර ඇති බවයි.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීමට අනුව සඳහන් කර ඇත්තේ, සැකකරුවන් පළායාම වැළැක්වීම සඳහා ඔවුන්ගේ ආරක්ෂාව සඳහා හා නීත්‍යානුකූල ආකාරයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකිරීම සඳහා පොලිස් ස්ථානයට රැගෙන විත් පරීක්ෂණ කටයුතු වලින් පසුව සැකකරුගේ අත්විලංගු මුදවා හැරීමට කටයුතු කළ බවයි. එහෙත් පොලිස් ස්ථානයට රැගෙන ඒමෙන් පසු අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේදී හැර කිසිදු විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සිදුකර ඇති බවට කිසිදු ලිඛිත සාක්ෂියක් නොමැත.

අදාළ යතුරු පැදිය පැමිණිලිකරුගේ බාල දරුවා වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර යන අය විසින් පොලිස් ස්ථානය වෙත පැදගෙන ආ බවත්, නැවත ඔහු විසින්ම පණගන්වාගෙන රැගෙන ගොස් ඇති බවත් වගඋත්තර පාර්ශවීය ස්ථානාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් වුවද, පැමිණිල්ලට අදාළව සිදුකරන ලද 2023.03.28 දිනැති පරීක්ෂණයේදී දෙවන වගඋත්තරකාර උ.පො.ප දිසානායක නිලධාරියා විසින් සිදුකර ඇති ප්‍රකාශයෙන් දක්වා ඇත්තේ, "වැඩිමහල් දරුවාගේ සාක්කුවේ තිබී ගංජා සුරුට්ටුවක් සොයගත් බවත්, බාල දරුවා සතුව කිසිදු මත්ද්‍රව්‍යයක් නොතිබූ නමුත් දරුවන්ගේ මානසිකත්වය හා වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා ජීප් රථයෙන් ඔවුන් දෙදෙනාව පොලිස් ස්ථානය වෙත එවා තමන් යතුරු පැදියෙන් පොලීසිය වෙත පැමිණි බවයි." පසුව ඔහු විසින්ම අදාළ යතුරු පැදිය පොලීසිය වෙත රැගෙන ආවේ තමා නොව පො.කො.ධනුෂ්ක නිළධාරියා විසින් බව 2023.03.28 පරීක්ෂණයේදීම පිළිගෙන ඇත. උ.පො.ප දිසානායක විසින් සටහන් තබා ඇති වැටලීම් සටහන් උධෘත අනුව, අදාළ යතුරු පැදිය පොලීසිය වෙත රැගෙන ආවේ 3 වන වගඋත්තරකාර පො.කො ධනුෂ්ක නිලධාරියා විසින් බව තවදුරටත් නිරීක්ෂණය වේ. පො.කො. ධනුෂ්ක නිලධාරියා විසින් යතුරුපැදිය තමන් විසින් රැගෙන ආ බවට 2023.03.28 දිනැති පරීක්ෂණයේදී , පරීක්ෂණ සටහන් වල සිය අත්සන යොදා පිළිගෙන ඇත.පො.කො. 81367 ධනුෂ්ක විසින් සටහන් තබා ඇති වැටලීම් සටහන් උධෘත අනුවද CP WM 4654 දරණ යතුරුපැදිය වෙලම්බඩ පොලිස් ස්ථානයට 2022.09.14 පදවා ගෙන එන ලද්දේ ඔහු විසින් බව සටහන් කර ඇතිබව නිරීක්ෂණය වේ.

මේ අනුව, වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීමෙහි පරස්පරතා පවතින බවට නිරීක්ෂණය වන අතරම පොලිස් ස්ථානාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් පරිදි, අදාළ යතුරුපැදිය පැමිණිලිකරුගේ බාල දරුවා වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර යන අය විසින් පොලිස් ස්ථානය වෙත පැදගෙන ආ බවට වන කරුණ අසත්‍ය බව පෙනීයයි.

තවද වගඋත්තර පොලිස් ස්ථානාධිපති වාර්තාවේ සඳහන් පරිදි පැමිණිලිකරුගේ බාල දරුවා විසින් යතුරු පැදිය පොලිස් ස්ථානය වෙත පදවාගෙන පැමිණියේ නම් , තම සහෝදරයා පොලිස් අත්අඩංගුවට පත්වීම පිළිබඳ තම නිවසට ගොස් මවට දැන්වීමේ හැකියාව තිබූ අතර, උ.පො.ප දිසානායක මහතා විසින් මවට දුරකථන ඇමතුමක් ලබාදීමෙන් පසු දරුවන් අත්අඩංගුවට පත්ව ඇති බව දැනගැනීම මඟින්ද එය තවදුරටත් තහවුරු වේ.

ආ.ක්‍ර.ව 13 (1) ව්‍යවස්ථාව මගින් නීතිය මගින් නියම කරනු ලැබූ කාර්‍යපටිපාටියට අනුව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකල යුත්තේය යනුවෙන් දක්වා ඇත. 1979 අංක 15 දරණ අ.න.වි.ස.

23(1) වගන්තියේ 1 වන පැහැදිලි කිරිම පරිදි, මෙම අවස්ථාවේදී පැමිණිලිකරුගේ දෙවන දරුවා වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර සුහසිංහ නැමැත්තා සාධාරණ සැකයකින් තොරව අත්අඩංගුවට ගැනීමක් සිදුකර ඇත. තවද සැකකරුවකු අත්අඩංගුවට ගැනීම රඳවා තබා ගැනිම පිලිබඳවත්, පොලිස්නිලධාරින්ට ඒ පිළිබඳව වූ වගකිම් සම්බන්ධවත්, ඊට අදාළව නීතිමය ප්‍රතිපාදන පිළිබඳවත් දෙපාර්තමේන්තු නියෝග A-20 මෙන්ම පොලිස්පති චක්‍රලේඛ 2747/2023 මගින් දක්වා තිබියදි ඒ පිළිබඳ නිසි වගකිමක් සහිතව ක්‍රියා නොකර අත්අඩංගුවට ගෙන විධිමත් ඇප ලබා දීමකින් තොරව මවට භාර දිම තුල නීත්‍යානුකූල නොවන අත්අඩංගුවට ගැනීමක් සිදුකර ඇති බව කරුණු නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවා වන එම්.එච්.කවිඳු හේෂාන් බණ්ඩාර යන අය සන්තකයේ ගංජා තිබූ බවට චෝදනා කරමින් ගම්පොල මහේස්ත්‍රාත් අධිකරණයේ මේ වන විට නඩු පවරා ඇති අතර, සැකකරු අදාළ චෝදනාවට නිවැරදිකරු බව ප්‍රකාශ කර ඇති බැවින් සැකකරුගේ නිදොස් බව අධිකරණය මගින් තීරණය කළ යුතු වේ.

මීට, පෙරදීද එම්.එච්.කවිඳු හේෂාන් බණ්ඩාර කලාකිරිඤ්ඤයක් ළග තබා ගැනීම යන චෝදනාව යටතේ තවත් නඩුවක් විභාග වෙමින් පවතින බවත් පෙනී යයි. කවිඳු හේෂාන් බණ්ඩාර ගංජා 410mg ළග තබා ගැනීම කර ඇති බව පොලීසිය ප්‍රකාශ කලද දේවින්ද බණ්ඩාර සුහසිංහ නැමැත්තා සම්බන්ධයෙන් පෙර වැරදි කිසිත් වාර්තා නොවන අතර මෙම අවස්ථාවේදී පොලිස් නිළධාරීන්ගේ ග්‍රහණයෙන් පළා යාමට තැත් කිරිමක්ද වාර්තා නොවේ. පොලිස් දෙපාර්තමේන්තු නියෝග A-20, 3 A වගන්ති ප්‍රකාරව, අත්විලන්ගු දැමීම ජ්‍යෙෂ්ඨ නිළධාරි අභිමතය පරිදි අත්අඩංගුවට ගත් තැනැත්තා අස්ථානයේ අවමානයට පත් නොවන පරිදි පැන යාම වළක්වන පරිදි කළ යුතුය. එබැවින්,එවැනි අවධානම් අවස්ථාවක් නොමැති විටකදී බාල දරුවාට අත්විලන්ගු දැමීම අනීතික බව නිරීක්ෂණය වේ.

පැමිණිල්ලට අදාළ පරීක්ෂණයේදී වගඋත්තරකාර 2,3 පොලිස් නිලධාරින් විසින් පැමිණිලිකරුගේ දරුවන් දෙදෙනාම තමන් විසින් අත්අඩංගුවට ගත් බවත්, යතුරු පැදිය වගඋත්තර පාර්ශවීය ධනුෂ්ක නැමැති පොලිස් නිලධාරියා පොලීසිය වෙත රැගෙන ආ බවත්, පිළිගෙන ඇති බැවින් පැමිණිලිකරුගේ බාල දරුවා වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර සුහසිංහ නැමැත්තා අත්අඩංගුවට ගෙන ඇති බව තහවුරු වේ.

තමන් යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේ දැයි අධික්ෂණය කිරීමට උසස් නිලධාරීන්ට යුතු කමක් ඇති බවත්, තම අධික්ෂණයට යටත් වන නිලධාරීන්ගේ හැසිරීම සියුම් ලෙස නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ යුතුකමක් බවත්, යටත් නිලධාරීන් මූලික අයිතිවාසිකම් කඩ කරද්දී ඔවුන්ව වගවීමකට ලක් නොකරන උසස් නිලධාරීන්ද එම මූලික අයිතිවාසිකම් කඩ කිරීමට වගකිව යුතු බවත්, වගවීමකට යටත් නොකිරීම මගින් දණ්ඩ මුක්තියේ පරිසරයක් ඇති කරන බවත්, එවැනි නිලධාරීන්ට විනය පියවර නොගැනීම මගින් නීතිය ඉදිරියේ සමානව සැලකීම උල්ලංඝනය කිරීමක් බවත් තුරෙයිරාජා

විනිසුරුතුමා විසින් <u>ආර්.ඒ.ඉරේෂා ලක්මාලි</u> එ. <u>නෙවිල් සිල්වා, කොළඹ අපරාධ කොට්ඨාශය සහ තවත් අය</u> (SCFR/505/19 ) නඩුවේ දී දක්වා ඇත.

1 වන වගඋත්තරකරු වන පොලිස් පරීක්ෂක ඩබ්.ඒඉන්දික ලලිත් මයා 2022.09.14 වන දින පොලිස් ස්ථානාධිපති ලෙස රාජකාරී කල අතර මෙම නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම ඔහුගේ දැනුවත්භාවය මත සිදුව ඇත්තක් බැවින් පොලිස් පරීක්ෂකවරයාට ආයතන ප්‍රධානියෙකුට ඇති අධීක්ෂණ වගකීමෙන් බැහැර විය නොහැක. එලෙසම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට නිරවද්‍ය නොවන වාර්තාවක් ලබාදීම තුලින් 1 වන වගඋත්තරකරුවා වින්දිත පාර්ශවයට සිදුවූ හානිය සඟවමින් කොමිෂන් සභාව නොමඟ යැවීමට කටයුතු කල බවට නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u> :-

මෙකී සමස්ත කරුණු අනුව, කිසිදු සාධාරණ හේතුවකින් තොරව පැමිණිලිකරුගේ බාල දරුවා වන එම්.එච්.ඕ. දේවින්ද බණ්ඩාර යන අයව නීතියට පටහැනි ආකාරයෙන් අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීමෙන් එම්.එච්.ඕ දේවින්ද බණ්ඩාර යන අයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 13 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති අත්තනෝමතික ලෙස අත්අඩංගුවට පත් නොවීමට ඇති මූලික අයිතිවාසිකම 1,2,3 වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවත්, 1 වන වගඋත්තරකරු වන ස්ථානාධිපති හට මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීමක් පැවරෙන බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

<u>නිර්දේශය</u> :-

01. පැමිණිලිකරුගේ දරුවා වන එම්.එච්.ඕ.දේවින්ද බණ්ඩාර යන අයව නීතියට පටහැනි ආකාරයෙන් අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීම හේතුවෙන් වූ අගතිය වෙනුවෙන්, 1,2,3 වගඋත්තරකරුවන් විසින් රු. 2500/- බැගින් රු. 7500/- ක මුදලක් පැමිණිලි පාර්ශවය වෙත ගෙවිය යුතුය.

02. වගඋත්තරකාර 1,2,3 නිලධාරීන්ගේ මෙම ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතුය.

2024.10.28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලකා මානව හිමිකම කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, පැමිණිලිකරු විසින්ද එකී නිර්දේශය ක්‍රියාත්මක ඉදිරිපත් කිරිමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා, - සුදුසු පියවර ගැනීමට
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. අධ්‍යක්ෂ, - අදාළ නිලධාරීන් වෙත නිර්දේශය යොමු කිරීමට
පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,
මානව හිමිකම් කොට්ඨාශය,
අංක : 07, 7 වන මහල, කොටා ටෙරස්
එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08.

04. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය, මහනුවර.

B/RAT